බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනය - **2021**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විද්‍යායතනයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විද්‍යායතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විද්‍යායතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විද්‍යායතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විද්‍යායතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විද්‍යායතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විද්‍යායතනය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| i. | මුදල් රෙගුලාසි 134(3) පරිච්ඡේදය | සමාලෝචිත වර්ෂය සඳහා වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණක විසින් අභ්‍යන්තර විගණන කටයුතු සිදුකර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත | අභ්‍යන්තර විගණන කටයුතු සිදු කල යුතුය. |
| ii. | මුදල් රෙගුලාසි 135 වගන්තිය | විද්‍යායතනයේ වවුචර් පිළියෙල කිරීම, මුදල් පොතෙහි සටහන් කිරීම, චෙක්පත් ලිවීම, බැංකු සැසඳුම් පිළියෙල කිරීම, සුළු මුදල් කටයුතු කිරීම හා ප්‍රසම්පාදනයන්, ඊට අයත් භාණ්ඩ ඇනවුම් කිරීම, ලැබීම්, ඉන්වෙන්ට්‍රිගත කිරීම වැනි රාජකාරි මුදල් රෙගුලාසි වලට පටහැනිව එකම නිලධාරිනියක විසින් ඉටු කර තිබුණි. | මූල්‍ය අංශය සඳහා වෙන්කර ඇත්තේ එක් කළමනාකරණ සහකාර නිලධාරියෙක් වන අතර කාර්යමණ්ඩල සංශෝධනයේදී අමතර ඉල්ලීම් කලද මේ දක්වා කිසිඳු සංශෝධනයක් සිදු වී නොමැත. | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කල යුතුය. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/ 2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | | | |
| | 12.1 ඡේදය | විද්‍යායතනය ආරම්භ කල 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම වාර්ෂික කාර්යසාධන වාර්තාව සභාගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | විධිමත් අනුමැතියකින් තොරව ප්‍රශ්න පත්‍ර සකස් කිරීම හා ප්‍රමිත කිරීම, විභාග රාජකාරී හා පිළිතුරු පත්‍ර ලකුණු කිරීම ආදිය වෙනුවෙන් වධිමත් අනුමැතියකින් තොරව ගෙවීම් සිදු කරනු ලබන අතර සමාලෝචිත වර්ෂය තුළ දී පමණක් රු. 793,175 ක් ගෙවා තිබුණි. | විශ්වවිද්‍යාල විද්‍යායතනයන්හි බාහිර කථිකාචාර්යවරුන්ට සහ අභ්‍යන්තර විභාග සඳහා ගෙවීම් කිරීමට NVQ 05 හා NVQ 06 සඳහා වන දීමනා පිළිබඳ ඉල්ලීමක් සිදු කරඇති අතර එම ඉල්ලීමට මෙතෙක් ප්‍රතිචාර ලැබී නොමැත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 2,206,032 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 2,569,081 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 4,775,113 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ඉකුත් වර්ෂයට සාපේක්ෂව පුනරාවර්තන ප්‍රදාන රු. 3,430,000 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනය 2016 ඔක්තෝබර් 18 වන දින සිට පනාවල බටංගල කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් අක්කර 5 ක ඉඩමක ස්ථාපිත කර ඇතත් විගණිත දිනය වන 2022 ජනවාරි 28 දින දක්වාම එම ඉඩම පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි. | ඉක්මනින් මෙම පවරා ගැනීම සිදු කර ගැනීම සඳහා දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා කටයුතු සම්පාදනය වෙමින් පවතින අතර අප ආයතනය මේ සම්බන්ධව නිරන්තර පසු විපරමකින් කටයුතු කරන ලදී. | කඩිනමින් ඉඩම පවරා ගැනීමේ කටයුතු නිම කිරීමට ක්‍රියා කල යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 නොවැම්බර් මාසයේ දී පාඨමාලා 6 ක් සඳහා ලියාපදිංචි වී ඇති සිසුන් 179 දෙනෙකුගෙන් සිසුන් 44 දෙනෙකු එනම් සියයට 25 ක් සමස්ත පාඨමාලාවම හැරගොස් තිබුණි. වසර 03 ක කාලපරිච්ඡේදයක් සඳහා පවත්වනු ලබන | 2020 වර්ෂයේ මුල් භාගයේ පටන් ආරම්භ වූ කෝවිඩ් 19 වසංගත තත්ත්වය ආශ්‍රිත හුදෙකලා තත්ත්වයන්, ආයතන වසා දැමීමේ තත්ත්වයන් ආදී කරුණු හේතුකොට ගෙන නියමිත කාල රාමුව තුල | සිසුන් පාඨමාලා හැරයාමට හේතු වූ කරුණු සොයා බලා ඒවාට පිළියම් යෙදීමටත් අදාල කාලය තුළ පාඨමාලා නිම කිරීමට |

| | | |
|---|---|---|
| මෙම පාඨමාලා සඳහා 2016 හා 2017 වසර වල බඳවාගත් සිසුන් 2022 මාර්තු මාසය අවසන් වන විටත් අධ්‍යයන කටයුතු අවසන් කර නොතිබුණි. | අවසන් කිරීමට නොහැකි වී පැවතුණි. | නිසි වැඩපිළිවෙලක් සැකසීමට කටයුතු කළ යුතුය. |

### 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය මගින් 2015 අගෝස්තු 24 දින විද්‍යායතනයේ ආගන්තුක සත්කාර කළමනාකරණ විද්‍යාගාරයේ නාන කාමරයක් ඉදිකිරීම සඳහා ලබාදී තිබූ රු. 464,400 ක් වටිනා නාන කාමර උපාංග විගණිත දිනය වූ 2022 ජනවාරි 31 දින වන විටත් උපයෝජනය කර නොතිබුණි. | නව ඉදිකිරීම් තාවකාලිකව අත්හිටුවීම සම්බන්ධව පවතින රාජ්‍ය ප්‍රතිපත්තිය හේතුවෙන් මෙම ඉදිකිරීම් කටයුතු අත්හිටුවා ඇත. | ප්‍රමාදයකින් තොරව ඉදිකිරීමේ කාර්යයන් ආරම්භ කර තිබුණි නම් එම වත්කම් ප්‍රයෝජනයට ගත හැකිව තිබුණි. කෙසේ වුවද අරමුණුගත කාර්ය සඳහා එම වත්කම් යොදාගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයේදී රු. මිලියන 02 ක ප්‍රතිපාදන මත දේශන පැවැත්වීම හා අනෙකුත් අධ්‍යයන කටයුතු මාර්ගස්ථව සිදුකිරීම සඳහා Learning Management system (LMS) පද්ධතියක් ස්ථාපිත කිරීමට මිල කැඳවීම් සිදුකර තිබුණි. එහෙත් තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ මත නැවත ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකිරීමට සිදුවී ඇති බැවින් එම කාර්යය 2022 මාර්තු මාසය අවසන් වනවිටත් ඉටුකර නොතිබුණි. | මෘදුකාංග සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවනු ලැබුවද එක් මිල කැඳවුමක් පමණක් ලද බැවින් වෙළඳපොලෙහි සිටින අනෙකුත් Microsoft Licening නියෝජිතයින් සපයන මිල සමඟ සැසඳිය යුතු බව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සඳහන් කර 2021 දෙසැම්බර් 28 වන දින වාර්තාව ඉදිරිපත් කරන ලදී. එබැවින් නැවත ප්‍රසම්පාදන ක්‍රියාවලියක් සිදු කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් නොමැති විය. | තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ මත ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාදයකින් තොරව ඉටු කල යුතුය. |